සැ. යු. - 2011.12.09 දින පළ වූ අංක 1,736 දරන ගැසට් පත්‍රයේ I-II (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,737 - 2011 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා - 2011.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1902 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1902 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1906 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 දෙසැම්බර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 දෙසැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිළ ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2012***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිළ ගණන් 2012 ජනවාරි මස 13 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවල දී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250.00 ක (රුපියල් දෙසිය පනහක) මුදලක් ගෙවා 2012 ජනවාරි මස 13 වැනි දින මධ්‍යාහ්න 12.00 තෙක් ලබාගත හැක.

උපලේඛනය

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාරගැනීම* |
|---|---|---|---|---|
| දකුණු පළාත | හම්බන්තොට | සූරියවැව (බිම් සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණු පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, හම්බන්තොට | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණු පළාත) පහල ඩික්සන් පාර, ගාල්ල |
| මධ්‍යම පළාත | නුවරඑළිය | කොත්මලේ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යමපළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, නුවරඑළිය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (මධ්‍යම පළාත) ගන්නොරුව, පේරාදෙණිය |
| වයඹ පළාත | කුරුණෑගල | කුරුණෑගල (බිම්සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (වයඹ පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, කුරුණෑගල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (වයඹ පළාත) කුරුණෑගල |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තරය ද සහිතව 2011 ජනවාරි මස 13 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

12-637

---

# රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පානදුර, මාදුපිටිය, සයිමන් ඩයස් මාවත, අංක 258/බී/1 හි පදිංචි (ජා. හැ. අ. 847840978 V හිමි) පීරා මුණසිංහලාගේ අනුරුද්ධිකා චාන්දනී ෆොන්සේකා වන මා විසින් සුරංකා මෙන්ඩිස් ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ අංක 854 හා 2008.10.31 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අත්සන් තබමින් බෝදර ගමගේ රංගනී ගුණසේකර යන අයට ලබා දෙන ලද ඇටෝර්නි බලපත්‍රය 2011.12.01 වැනි දින සිට අවලංගු කරන බව සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස මින් ප්‍රකාශ කරමි.

12-648

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත

**බ්‍රෑන්ඩ් ලැබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පී වී 82632**

ඉහත සඳහන් සමාගම 2011 නොවැම්බර් මස එකොළොස් (11) වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 14/9, හුණුපිටිය පාර, කොළඹ 02 යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 156 1/8, අළුත්කඩේ වීදිය,
කොළඹ 12.

12-617

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : හයිටෙන් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2011 නොවැම්බර් 18
3. සමාගමේ අංකය : පී. වී. 82568
4. ලියාපදිංචි ලිපිනය : අංක 169/2, හිල් වීදිය, දෙහිවල

එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස්,
(ප්‍රයිවට් ලිමිටඩ්),
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

12-631

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදෂ්ඨ කිරීම

නෙදර්ලන්තයේ, එම්. ඩී. නිමේගන්, 6522 උබාග්ස්එවල්වෙග් 85 හි පදිංචි ජැන්සන් තියඩෝරා විල්හෙල්මිනා ජොහානා මරියා වන මම, බේරුවල ගොඩැල්ල, මලවගොඩ පාර, පදිංචි දිනයදුර ඩුලිප් සමන්ත ද සිල්වා නමින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ත ඩී. හෙට්ටිආරච්චි විසින් සහතික කරන ලද අංක 2525 දරන 2004 ජනවාරි මස 4 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨකර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී දිනයදුර ඩුලිප් සමන්ත ද සිල්වා විසින් මා උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි යම් දෙයක් ගැන මම වගකීම නොදරනවා ඇත.

ජැන්සන් තියඩෝරා විල්හෙල්මිනා ජොහානා මරියා.

2011 නොවැම්බර් මස 29 වැනි දින දී ය.

12-634

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ කෙරෙන සමාගම් නම වෙනස් කිරීම පිළිබඳ නිවේදනයයි

සමාගමේ නම : කොමර්ෂල් ලීසිං කම්පනි ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PQ 131 PB
ලියාපදිංචි ලිපිනය : අංක 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04
සමාගමේ නව නම : කොමර්ෂල් ලීසිං සහ ෆිනෑන්ස් ලිමිටඩ්

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2011 නොවැම්බර් මස 01 වැනි දින.

12-594

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර නම වෙනස් කිරීම පිළිබඳ නිවේදනය

සමාගමේ නම : ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැණි පී එල් සී
ලියාපදිංචි අංකය : පී බී 244 PQ
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
නව සමාගමේ නම : ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පී එල් සී

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2011 ඔක්තෝබර් මස 17 වැනි දින.

12-595

## දැන්වීමයි

සේවියන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2011 නොවැම්බර් මස 22 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සේවියන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82471
ලියාපදිංචි කාර්යාලය : අංක 06, ජෝසප් ලේන්, කොළඹ 04

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙකට්රීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-653

## සංස්ථාපනය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බවට කරනු ලබන දැනුම් දීමයි

බේ කොමියුනිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංක පී. වී. 79851 යටතේ 2011 ජූලි මස 06 වැනි දින සංස්ථාපනය කර ඇති අතර එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10 යන ස්ථානයේ පිහිටා ඇත.

සෙරින් හොටෙල් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංක පී. වී. 79100 යටතේ 2011 මැයි මස 31 වැනි දින සංස්ථාපනය කර ඇති අතර එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 40/2, ලේක් ගාර්ඩන්ස්, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

ලක්ෂරි ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංක පී. වී. 78637 යටතේ 2011 මැයි මස 04 වැනි දින සංස්ථාපනය කර ඇති අතර එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 20, උපාලි මාවත, වාද්දුව යන ස්ථානයේ පිහිටා ඇත.

සෙරින් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංක පී. වී. 79206 යටතේ 2011 ජූනි මස 03 වැනි දින සංස්ථාපනය කර ඇති අතර එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 40/2, ලේක් ගාර්ඩන්ස්, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

ජෝසෆ් ගෝල්ඩ්මෑන් ට්‍රස්ට් ඕෆ්ෂෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් අංක පී. වී. 78887 යටතේ 2011 ජූනි මස 03 වැනි දින සංස්ථාපනය කර ඇති අතර එකී සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 130, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටා ඇත.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (පීවීටී) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

12-649

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : සමගි ජේවස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82089
ලියාපදිංචි දිනය : 2011.10.24
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 118, ගාලු පාර, හේනමුල්ල, පානදුර.

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම,
සමාගම් ලේකම්වරු.

12-543

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඇපෙක්ස් කැබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 82087
ලියාපදිංචි දිනය : 2011.10.24
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 104/A/2, කටුවාවල, බොරලැස්ගමුව

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම,
සමාගම් ලේකම්වරු.

12-544

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : ජයසිංහ රබර් ස්ටෝර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 82513
සංස්ථාගත කළ දිනය : 2011.11.16
සමාගමේ ලියාපදිංචි ලිපිනය : "ජයවිල" මාහිංගල පන්සල පාර, බෝපෙ, පාදුක්ක.

ජයසිංහ රබර් ස්ටෝර්ස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් අධ්‍යක්ෂක.

2011 නොවැම්බර් මස 18 වැනි දින.

12-541

---

## දැන්වීමයි

සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නම 2011 නොවැම්බර් මස 14 වැනි දින සිට වෙනස් වූ බව මෙයින් දන්වමු.

පෙර තිබූ නම : ලක්ෂපාන රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව නාමය : විල්ලා රෝසා රියල් එස්ඩ්ටෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 75665

සමාගම් ලේකම්වරු.

12-558

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත නම් සඳහන් සමාගම ලියාපදිංචි කරන ලද බවට දැන්වීම

සමාගමේ නම : ජී. එම්. එන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 82557
ලියාපදිංචි කරන ලද දිනය : 2011.11.17
ලියාපදිංචි කාර්යාලය : අංක 209, බොරුපන පාර, රත්මලාන

12-549

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නාමය : සාෂා මැෂින් ඇන්ඩ් ඉක්විප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82680
ලියාපදිංචි ලිපිනය : අංක 174, කලපලුවාව, රාජගිරිය.

සමාගම් ලේකම්.

12-548

---

## ඇටෝර්නි බලය අත්හැරීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කන්ජුක්කුලිය, මුගුණුවටවන පදිංචි අර්සකුලසූරිය තනිප්පේරුගේ මිල්ටන් ජයන්ත කුරේරා වන මා වෙත දංකොටුව, ගොඩැල්ල, අංක 84/2 හි ස්ථිර ලිපිනයැති දැනට විදෙස් ගතව සිටින වර්ණකුලසූරිය තුසිත දිනේෂ් සුරංග ප්‍රනාන්දු යන අය විසින් 2010.11.21 දින ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී අත්සන් කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය කුරුණෑගල සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ 2010.11.30 වැනි දින 2811 දිනපොත් අංකයේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 38 කාණ්ඩයේ 2325 පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලය මගින් මා හට ලබා දී තිබුණු සියලුම බලතල සියල්ලක් ම වලංගු නොමැති බවත් එම ඇටෝර්නි බලය වලංගු නොමැති බවත් එම ඇටෝර්නි බලපත්‍රය මගින් මින් පසු මා ක්‍රියා නොකරන බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහ ජනයාටත් දැනුම් දෙමි.

අර්සකුලසූරිය තනිප්පේරුගේ මිල්ටන් ජයන්ත කුරේරා.

2011 නොවැම්බර් මස 25 වැනි දින.

12-482

---

## දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්තේ හි පදිංචි ජයසිංහ ආරච්චිගේ විජිතා ජයසිංහ වන මම සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස හෙළිදරව් කර සිටින්නේ වර්ෂ 2011 මාර්තු මස 14 වැනි දින සිට මාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්තේ අංක 105 බී දරන තැන පදිංචි ජා. හැ. පත්. අංක 662940500 වී දරන රවීන්ද්‍ර කුමාර විතාන් දොන් ලියනගේ යන අය බී. පී. ඩී. සී. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැනගේ අංක 2988 සහ 2989 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍ර වලින් පත්කල අතර ඔහු විසින් මාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් එකී ඇටෝර්නි බලය අනිසිලෙස යොදාගෙන ඇති හෙයින් අද පටන් මින් ඉදිරියට ඔහු මාගේ ඇටෝර්නි බලකරු නොවන බවයි. එකී ඇටෝර්නි බලපත්‍ර බලශූන්‍ය බවත් මෙයින් දැනුම් දෙමි.

එසේ හෙයින් මාගේ නමින් ඔහු විසින් කරනු ලබන සියලු ක්‍රියාවන් බලරහිත හා ශූන්‍ය ක්‍රියාවන් බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

12-486

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ජාඇල, කපුවත්ත, ෆාතිමා පාර, අංක 03 දරන ස්ථානයේ පදිංචි වෙල්ල ෆැන්සිකුගේ ජුට්නා ක්‍රිෂේනි සෝවිස් වන මා ශ්‍රී ලංකා ජනරජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටින්නේ, මා විසින් ජාඇල, කපුවත්ත ෆාතිමා පාරේ, අංක 03 හි පදිංචි කුරුකුලසූරිය මේරියන් ෂර්වන්ති ක්‍රිනා සෝවිස් විවාහයට පෙර ප්‍රනාන්දු වන අයට මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් දයා විමල් ද මෙල් ලියා සහතික කරන ලද අංක 952 සහ 2004.06.12 දිනැති ඇටර්නි බලකරය මගින් දී ඇති සියලු බලතල මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දැනුම් දී සිටින අතර, තව ද අද දින සිට මින් ඉදිරියට ඉහත කී ඇටර්නි බලපත්‍රය ශූන්‍ය, බලරහිත බව ද මෙයින් දැනුම් දෙමි.

වෙල්ල ෆැන්සිකුගේ ජුට්නා ක්‍රිෂානි සෝවිස්.

2011 නොවැම්බර් මස 24 වැනි දින.

12-528

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ඉන්වෙන්චර් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 82472
ලියාපදිංචි කළ දිනය : 2011.11.14
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 64, පාසැල් මාවත, දුම්රියපළ පාරට ඔබ්බෙන්, දෙහිවල.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

12-487/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු :-

ලියාපදිංචි සමාගමේ නම : එස්. කේ. අයි. වෙන්චුරා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 82507
ලියාපදිංචි කළ දිනය : 2011.11.15
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 453/1, පළමු මහල, හැව්ලොක් පාර, කොළඹ 06.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

12-487/2

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, වටපුලුව ධර්මාශෝක මාවත, අංක 27/5 හි පදිංචි උක්වත්තේ ලියනගේ නයෝමි චන්දිමා වන මා විසින් මහනුවර, වටපුලුව, ධර්මාශෝක මාවත, අංක 27/5 හි පදිංචි උක්වත්තේ ලියනගේ නන්දසේන නමැති අයට 2008.01.25 වැනි දින ඉ. එම්. පී. කේ. ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කළ අංක 1722 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ඇටෝර්නි බලපත්‍රය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වග නොකියන බව ද ප්‍රකාශ කරනු ලැබේ.

උක්වත්තේ ලියනගේ නයෝමි චන්දිමා.

12-489

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකත්ව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ කොළඹ 08, රොඩ්නි වීදිය, අංක 20/15 ඒ හි මෙසස් එල්. පී. පී. (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ දංකොළුව පිහිටි හෙට්ටිගොඩ හෙට්ටිගොඩහේන වැලිගොඩ, ඔකඳවත්ත, ජයසිංහවත්ත, වැලිවිටවත්ත, ලොට් සී පුවක්වත්ත ජයසිංහවත්ත ලොට් ඒ සහ බී තුඩැල්ලවත්ත, ඕවිටපැලවත්ත, දෙදියාගලගේවත්ත වැලිගොඩඕවිට, වැලිගොඩකුඹුර සහ දංගහලියද්ද ලොට් ඩී නමැති යාබද ඉඩම්වල ලොට් 2 හි ලොට් 2 බී හි වෙන් කළ ලොට් 2 බී 2 න් බෙදා වෙන් කරන ලද ලොට් 2 එෆ් නමැති බිම පළතුරු ගස් සහ සියලු වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග සම්පූර්ණ ඉඩම අක්කර පහයි රූඩ් දෙකක් (අ. 5 රූ. 2 පර්. 0) විශාල ඉඩම.

එකී ලොට් 2 එෆ් පහත විස්තර කරනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසක් වේ.

පෙර කී දංකොළුව පිහිටි හෙට්ටිගොඩ, හෙට්ටිගොඩහේන, වැලිගොඩ ඔකඳවත්ත, ජයසිංහවත්ත සහ තුඩැල්ලවත්ත, ඕවිටපැලවත්ත, දෙදියාගලගේවත්ත, වැලිගොඩ ඕවිට, වැලිගොඩ කුඹුර සහ දංගහලියද්ද ලොට් ඩී නමැති යාබද ඉඩම්වල ලොට් 2 හි ලොට් බී හි බෙදා වෙන් කළ ලොට් බී 2 නමැති බිම්, පළතුරු ගස් සහ සියලු වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග සම්පූර්ණ ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් සාදන ලද 1986.06.02 දිනැති එකී අංක 230 දරන සැලැස්ම අනුව අක්කර එකොලහයි රූඩ් තුනයි පර්චස් තිස්පහක් (අ. 11 රූ. 3 පර්. 35) විශාල ඉඩම. මෙය කොටපොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 2/92 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 2 එෆ් බලයලත් මිනින්දෝරු ඕ. එම්. ප්‍රේමසිරි විසින් සාදන ලද 2006.10.01 වැනි දිනැති අංක 69/21 දරන සැලැස්ම මගින් මෑතක නැවත මැන ප්‍රමාණය අක්කර පහයි රූඩ් දෙකක් (අ. 5 රූ. 2 පර්. 0) විශාල ලොට් 2 එෆ් ලෙස නිරූපනය කර ඇත.

ඉහත සඳහන් දේපළ 2012 ජනවාරි මස 10 වැනි දින පස්වරු 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - පිටබැද්දර නගරයේ සිට සියඹලාගොඩ මාර්ගය ඔස්සේ මීටර් 300ක් පමණ ගිය විට ඇති දංකොලුව මංසන්ධියෙන් වම්පසට ඇති සියඹලාගොඩ බටහිර පාරට හැරී තවත් මීටර් 500ක් පමණ ඉදිරියට ගිය විට මාර්ගයේ දකුණු පස අදාල ඉඩම පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම .-* රජයේ ගැසට් පත්‍රයේ 2010.10.29 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.10.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.10.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 , 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න .- ප්‍රධාන කළමනාකරු (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-552

## සෙලාන් බැංකුව පිඑල්සී ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ රාගම පදිංචි ඇන්තනී රන්ජන් මැතිව්ස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ (රාගම උප කාර්යාලය) රාගම පිහිටි බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් අඳින ලද 2005 දෙසැම්බර් මස 21 වැනි දිනැති අංක 2005/410 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රොසලින් එස්ටේට් නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ලොට් 03 පහත විස්තර කරනු ලබන ලොට් එෆ් 1න් බෙදා වෙන් කරන ලද කොටසක් වේ :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ (රාගම උප කාර්යාලය) රාගම පිහිටි බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් අඳින ලද 2005 දෙසැම්බර් මස 20 දිනැති අංක 2005/398 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රොසලින් එස්ටේට් නමැති ඉඩමේ ලොට් එෆ් 1 (පෙර කී අංක 984 දරන සැලැස්මේ නිරූපනය වන පවත්නා මායිම් මත නැවත මනින ලද ලොට් එෆ් වන) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් 30 (අ. 1 රූ. 0 පර්. 30) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්‍රිරුව බී 596/33 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ (රාගම උප කාර්යාලය) රාගම පිහිටි බලයලත් මිනින්දෝරු නලින් හේරත් විසින් අඳින ලද 2005 දෙසැම්බර් මස 21 දිනැති අංක 2005/410 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන රොසලින් එස්ටේට් නැමති ඉඩමේ ලොට් ආර්. 1 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසි නවයයි දශම පහයි නවයක් (අ. 0 රූ. 0 පර්. 29.59) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 ජනවාරි මස 18 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - පෑලියගොඩ සිට මීගමුව ප්‍රධාන මාර්ගයේ කි. මී. 10.5 පමණ ගිය විට හමුවන නාගොඩ හන්දියෙන් දකුණට ඇති අනියකන්ද පාරේ කි මී. 1.5ක් පමණ ගොස් දකුණුපස ඇති අඩි 20ක් පළල තාර පාරට හැරෙන්න. මෙම පාර ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් විසින් මීඩ් සිටි නමැති ඉඩම් කොටස් කර ඇති ඉඩම් සඳහා යෑමට වෙන් කරන ලද පාර වේ. අදාල දේපළ මෙම පාර වම්පස දෙවැනි ඉඩම් කොටස වේ.

*යෝජනා සම්මුති දැන්වීම.*- රජයේ ගැසට් පත්‍රයේ 2010.10.29 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.10.28 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2010.10.26 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 0113068185, 2572940.

12-554

---

## සොලන් බැංකුව පීඑල්සී - කඩවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල කඩවත පදිංචි ඩිංගිරිගේ චමින්දි පුෂ්ප කුමාරි යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

### 1 වැනි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙල්ගොඩ උප කාර්යාල සීමාව තුළ ඉහළ බියන්විල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද 1997.12.23 දිනැති අංක 320/1997 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ජම්බුගහවත්ත කොටස නමැති එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 320/1997 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. , පර්. 20) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 645/240 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2012 ජනවාරි මස 17 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කඩවත කොමර්ෂල් බැංකුව අසලින් ආරම්භ වන ශ්‍රමදාන මාවතට හැරී තවත් කි. මී. 1 ක් පමණ ඉදිරියට ගිය විට ඇති සමෘද්ධි බැංකුව ඉදිරිපිට පාරේ දකුණු පස අදාළ දේපල පිහිටා ඇත.

## 2 වැනි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෙයියන්තුඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 1992.05.24 වැනි දිනැති අංක 96/92 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමේ ලොට් 42 ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 96/92 දරන සැලැස්ම අනුව පර්චස් දහහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 816/26 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2012 ජනවාරි මස 17 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කිරිබත්ගොඩ සිට සපුගස්කන්ද මාර්ගයේ කි. මී. 2 ක් පමණ ගොස් වම්පසට ඇති උඩුපිල මාර්ගයට හැරෙන්න. එම මාර්ගයේ ද තවත් කි. මී. 2 ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති ජාතික තරුණ සේවා සභාව පිහිටා ඇති පැරකුම් මාවතට හැරී එම මාර්ගයේ ඉදිරියට ගොස් ජාතික තරුණ සේවා සභාව පිහිටි ඉඩමේ කෙළවරින් දකුණු පසට ඇති අඩි 15 ක් පමණ පළල ඇති මාර්ගයේ ගිය විට අදාල දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- *රජයේ ගැසට් පත්‍රයේ* 2010.05.21 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් වල 2010.05.14 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2010.05.26 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දු.ක. 011-2456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 0113068185, 2572940

12-553

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හැටන් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු හැටන් ෆෘට්හිල් ගමේ ෆෘට්හිල් එස්ටේට් නමැති ඉඩමෙන් බලයලත් මානක ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1987.01.14 වන දින අංක 3240 පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් අංක 7 දරන ආරියගම වරිපනම් අංක 19/81 දරන දේපල හා එහි ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 10.

මෙම දේපල, කරුප්පනන් ක්‍රිෂ්ණකුමාර් යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- හැටන් නගරයේ සිට දිඹුල්ල පාරේ කි. මී. 1.5 ක් පමණ අවිස්සාවේල්ල -නුවරඑළිය හන්දිය දක්වා පැමිණ වමට හැරී ෆෘට්හිල් පාරේ මීටර් 200 ක් පමණ විත් වමට හැරී ආරියගම නිවාස සංකීර්ණය පාරට පිවිස ඉදිරියට මීටර් 100 ක් පමණ ගමන් ගත් විට පාරේ දකුණු දෙසින් අදාල දේපල පිහිටා තිබේ.

2011 ක් වූ දෙසැම්බර් මස 30 වන දින පෙ.ව. 9.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.09.17 දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංක : 081-2210595/071-4755974/071-8446374/077-7761706.

12-635

HNB 1H5 - 11

**හැටන් නැෂනක් බැන්ක් පීඑල්සී - ගම්පහ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2008.06.06 දින සහ අංක 6884 සහ 2008.12.30 වැනි දින අංක 7203 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම ලංකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඞ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිම පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2012 ක් වූ ජනවාරි මස 05 වැනි දින ප. ව. 3.30 ට එම දේපළ පිහිටි ස්ථානවල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.* - බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්පහ මැදගම පිහිටි යක්කල පාර වරිපනම් අංක 135 දරන කීනගහලන්ද සහ කීනගහඹිවිට නමැති ඉඩමට බලයත් මිනින්දෝරු එච්. ඒ. එන්. ජී. රණසිංහ විසින් මැන සාදන ලද 2002.04.02 දින සහ අංක 287 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කළ ඉඩම් ගොඩනැගිලි සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය රූඩ් දෙකක් (අ. 0 රූ. 2 පර්. 0)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.11.18 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2011.11.18 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගම්පහ නගර මධ්‍යයේ සිට යක්කල පාරේ මීටර් 500ක් පමණ දුරක් ගියවිට ආනන්ද මාවතට මෙපිටින් වම් අත පැත්තේ ඇති "නාලන් මෝටර්ස්" නමැති ප්‍රශ්චිත දේපළට ළඟාවිය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැංක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත්
වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0112 - 345975.

12-647

---

HNB 144 - 11

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වැල්ලවත්ත ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2009.12.04 දින සහ අංක 780 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2010.08.12 දින සහ අංක 2681 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම ගුණනායගම් රාජන් සේවියර් එම්මැනුඑල් සහ මේරි යුවරිස්තා එම්මැනුඑල් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2012 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානවල දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, මඩකලපුව මහ නගර සභා සීමාව තුළ වසම් අංක 11 උරානි ගමෙහි සෙල්වනායගම් පාරෙහි පිහිටි වරිපනම් අංක 60/9ඒ දරන බලයලත් මිනින්දෝරු ඒ. සිංගරාජා විසින් මැන සාදන ලද 2009.07.20 දින සහ අංක ඒ. එස්./09/එම්.එන්/968 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් දාහතරයි දශම හතයි හතරක් (අ. 0 රූ. 0 පර්. 14.74)

ඉහත කී ඉඩම් කොටස මෙහි පහත සඳහන් ඉඩම් කොටසින් බෙදා වෙන් කළ හා නිශ්චිත ඉඩම් කොටසක් වේ.

ඉහත කී උරානි හි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එස්. සෙල්වරත්නම් විසින් මැන සාදන ලද 1973.03.06 දිනැති අංක 420 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 13 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ.

විශාලත්වය පර්චස් තිස්එකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 31.5)

එකී අංක 780 සහ 2681 දරන බැඳුම්කරයන්හි දෙවැනි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.10.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.11.02 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මෙම දේපළට සෙල්වනායගම් පාරෙන් ඔබ්බට ඇති පටුමගකින් ළඟාවිය හැකිය. (මඩකලපුව සෙල්වනායගම් පාරේ වරිපනම් අංක 60/9 ඒ)

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැංක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835 ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත්
වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441
0714 - 424478
ෆැක්ස් අංකය : 0112 - 345975.

12-646

## සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවෙට් බෑන්කිං යුනිට්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල කොළඹ 03 පදිංචි වෛද්‍ය රොකාන් ලලිත් විජේසුන්දර යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

### උපලේඛනය

යුනිට් 01ඒ/එෆ්11/යූ6-11 වැනි මහල

මෙම ඒකකය කොළඹ 02 හයිඩ් පාක් කෝනර් හි තට්ටු නිවාසවල 11 වැනි මහලෙහි අංක : 79 11/2 (Apartment) අනු නිවස වේ. එයට මායිම්:

උතුරට : පොදු අංග (අයිසීඊ 11) ට උඩින් ඇති අවකාශයෙන් මෙම ඒකකය වෙන් කෙරෙන බිත්තිය ද, නැගෙනහිරට : මෙම ඒකකය පොදු අංග (අයිසීඊ3) වෙන් කෙරෙන බිත්තිය ද මෙම ඒකකය ඒකක 1ඒ/එෆ්11/යූ7න් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යය සහ මෙම ඒකකය පොදු අංග අයිසීඊ20න් වෙන් කෙරෙන බිත්තියද, දකුණට : මෙම ඒකකය පොදු අංග අයිසීඊ20 න් වෙන් කෙරෙන බිත්තිය සහ මෙම ඒකකය ඒකක 1ඒ/එෆ්11/යූ5න් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යයද බස්නාහිරට : මෙම ඒකකය ඒකක 1ඒ/එෆ්11/යූ5න් වෙන් කෙරෙන බිත්තියේ මධ්‍යය, මුදුනින් : මෙම ඒකකය වහළ මුදුනින් වෙන් කෙරෙන කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යය පොළව යට මුදුන : මෙම ඒකකය ඒකක 1ඒ/එෆ්10/යූ6න් වෙන් කෙරෙන කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යයද, බිම් ප්‍රමාණය : වර්ග මීටර් 175. 356 (වර්ග අඩි 1887.516)

මෙම ඒකකයට සාලයක්, කෑම කාමරයක්, නිදන කාමර 3 ක්, පැන්ට්‍රිය, ගබඩා කාමරය, ටොයිලට් 3 ක් ඩ්‍රයිං යාඩ් එකක් සහ බැල්කනි දෙකක් ඇත.

මෙම තට්ටු නිවාස දේපලෙහි පොදු අංගයන්වල මෙම ඒකකයේ කොටස් වටිනාකම 1.144% ක් වේ. මෙම ඒකකය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිකාව කොන් ඒ 105/246 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒකකය සඳහා කඩිනම් ප්‍රවේශ ප්‍රදේශය : ඒකක අයිසීඊ 20 වේ. 1ඒ/එෆ්11/යූ6/ඒ2 දරන උපාංග ඒකක සමග වෙන් කිරීමට ඇති මෙම ඒකකය ලොට් 1 හි අතුරු බෙදන ලද ඒ ගොඩනැගිල්ලේ ඒකකයකි.

### ව්‍යවස්ථාපිත පොදු අංගයන්

මෙම සහාධිපත්‍ය දේපලෙහි ව්‍යවස්ථාපිත පොදු අංගයන් 1982 අංක 45 (සංශෝධිත) දරන පනතේ 12 වැනි වගන්තිය මගින් සංශෝධිත පරිදි 1973 අංක 11 දරන බද්ධ නිවාස හිමිකාරත්ව නීතියේ 26 වැනි වගන්තියෙන් සලසා ඇති පරිදි වේ.

(ඒ) ගොඩනැගිල්ල පිහිටි ඉඩම, සහාධිපත්‍ය දේපලට අදාළ විවෘත ඉඩකඩ ඇතුළුව,

(බී) ගොඩනැගිල්ලේ අත්තිවාරම, කුළුණු, බාල්ක, යටලී, ආධාරක, ප්‍රධාන බිත්ති සහ රූෆ් ටොප් ටෙරස් ද වේ.

(සී) විදුලිය, පොරොත්තු ජෙනරේටර් සමග, ඉන්ධන ගබඩා ටැංකිය, ජල සැපයුම, ජලනල, ජල සම්පීඩක, උඩ වතුර ටැංකිය, පොම්ප ආදී කේන්ද්‍රීය සේවා සඳහා සවිකිරීම්.

ජලාපවහන පද්ධති සහ අපත ජල නිශ්කාශන ක්‍රම - පයිප්ප, සම්ප්ස්, මැන්හෝල්ස්, පොම්පවලින් සමන්විත ගිණි රැකවරණය සහ ඩිටෙක්ටිව් සිස්ටම් - ස්මෝක් ඩිටෙක්ටර්ස්, ෆයර් පම්ප්ස්, හෝස් රීල්ස්, ගිනි නිවන යන්ත්‍ර, අනතුරු හැඟවීමේ ක්‍රමවලින් සමන්විත, සිරස් ගමනාගමන ක්‍රම - සෝපාන 2 කින් සමන්විත, වෙන්ටිලේෂන් සිස්ටම් - සංවාතන සහ පිටකරණ සිදුරු සහ එක්ස්පෙලර් පැන්ස්වලින් සමන්විත - එම්ඒටීවී සිස්ටම් - කේබ්ලිං ඇම්ප්ලිපයර් සහ හෙඩ් එන්ඩ් උපකරණවලින් සමන්විත, ආරක්ෂක අනතුරු ඇඟවීමේ ක්‍රම, සීසීටීවී කැමරා, මොනිටර් සිස්ටම් සහ එලාම් සිස්ටම්වලින් සමන්විත,

කසල නිශ්කාශන ක්‍රම ප්‍රවාහනය සඳහා කසල දමන ස්ථානයකින් සමන්විත

ඩී. දේපලෙහි පැවැත්ම, නඩත්තුව, ආරක්ෂාව හෝ සාමාන්‍යයෙන් පොදු පාවිච්චිය සඳහා දේපලෙහි අවශ්‍ය සියලු වෙනත් කොටස් සහ පහසුකම්

**පොදු අංගයන්ගේ අර්ථ කථනය සහ විස්තර**

පොදු අංගයන්ගේ අර්ථ කථනය සහ විස්තර - පිඹුරේ පිටුවල විස්තර කර නිරූපනය කර ඇති ප්‍රදේශ ඃ

අයිසීඊ1 (ඒ) ගොඩනැගිල්ලේ වටා ඇති ඉඩම සහ විවෘත ඉඩකඩ සහ ගොඩනැගිල්ලට ප්‍රවේශ මාර්ගය

අයිසීඊ1 (බී) සංවාතනය සඳහා විවෘත ඉඩකඩ

අයිසීඊ1 (සී) ඉඩම සහ ප්‍රවේශ මාර්ගය පොදුවේ සියලු ඒකක විසින් පාවිච්චි කිරීම සඳහා වේ.

අයිසීඊ1 (ඩී) ගොඩනැගිලි ඒකකවල අවට ප්‍රදේශයෙහි ඇති සේවා කවුළු (සර්විස් ඩක්ටීස්)

අයිසීඊ 2 මෙය පළමුවෙනි මහලේ සිට වහල මුදුන දක්වා වායුසමීකරණ තබා ගැනීම සඳහා විවෘත ඉඩකඩ වේ.

අයිසීඊ 3 මෙය පළමුවෙනි මහලේ සිට වහල මුදුන දක්වා වායුසමීකරණ උපකරණ තබා ගැනීම සඳහා විවෘත ඉඩකඩ වේ.

අයිසීඊ 4 මෙය පළමුවෙනි මහලේ සිට වහල මුදුන දක්වා වායුසමීකරණ උපකරණ තබා ගැනීම සඳහා විවෘත ඉඩකඩ වේ.

අයිසීඊ 5 මෙය පළමුවෙනි මහලේ සිට වහල මුදුන දක්වා වායුසමීකරණ උපකරණ තබා ගැනීම සඳහා විවෘත ඉඩකඩ වේ.

අයිසීඊ 6 මෙය පොදු පාවිච්චිය සඳහා ඇති යාන්ත්‍රික සහ ජලනල කවුළු වේ.

අයිසීඊ 7 මෙය පොදු පාවිච්චිය සඳහා ඇති යාන්ත්‍රික සහ ජලනල කවුළු වේ.

අයිසීඊ 8 මෙය පොදු පාවිච්චිය සඳහා ඇති යාන්ත්‍රික සහ ජලනල කවුළු වේ.

අයිසීඊ 9 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් ලවුන්ජ් ලොබ් ආරක්ෂක කාමරය, ට්‍රාන්ස්පෝමර් කාමරය, සීඊබී මීටර් කාමරය, ඉලෙක්ට්‍රිකල් පැනල් රූම් රිසෙප්ෂන්, ගෑස් සිලින්ඩර් ගබඩාව සහ ඩ්‍රයිව් වේ. මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා බිම් මහලෙහි ඇත.

අයිසීඊ 10 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා පළමු මහලෙහි ඇත.

අයිසීඊ 11 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා දෙවෙනි මහලෙහි ඇත.

අයිසීඊ 12 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා තුන්වෙනි මහලෙහි ඇත.

අයිසීඊ 13 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර්, ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චි සඳහා හතරවෙනි මහලෙහි ඇත.

අයිසීඊ 14 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා පස්වෙනි මහලෙහි ඇත.

අයිසීඊ 15 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට් විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා හයවෙනි මහලෙහි ඇත.

අයිසීඊ 16 මෙම කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා හත්වෙනි මහලෙහි ඇත.

අයිසීඊ 17 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා,කවුළු කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වොල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය -මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා අටවෙනි මහලෙහි ඇත.

අයිසීඊ 18 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා නවවෙනි මහලෙහි ඇත.

අයිසීඊ 19 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට්, විවෘත ප්‍රදේශය - මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා දහවෙනි මහලෙහි ඇත.

අයිසිඊ 20 මෙය කොරිඩෝව, මුර කාමරය, සෝපාන සේවා, කවුළු, කසල කාමරය, පයර් කැබිනට්, ලෝ වෝල්ටේජ් ඩක්ට් සහ එයාර් ප්‍රෙෂර් ඩක්ට් විවෘත ප්‍රදේශය, මෙම ප්‍රදේශය පොදු පාවිච්චිය සඳහා එකොළොස්වෙනි මහලෙහි ඇත.

අයිසීර් 21 ජෙනරේටර් රූම්, මෝටර් රූම්, කූලිං ටවර්, සර්විස් ඒරියා, ස්ටෝර්ස්, ස්ටෙයා වේ සහ විවෘත ප්‍රදේශය යන මේවා පොදු පාවිච්චිය සඳහා රූෆ් ටොප් හි ඇත.

අයිසීර් 22 මෙය ස්මෝක් ලොබි, ලිෆ්ට්, පයර් ලිෆ්ට්, සර්විසස්, ඉලෙක්ට්‍රිකල් ඩක්ට්, ඩ්‍රයිව් වේ. පම්ප්රූම් සම්ප්ස්, සෙකියුටරි රූම්ස්, මුර කාමර සහ ටොයිලට්ස්. මේවා බේස්මන්ට් හි පොදු පාවිච්චිය සඳහා ඇත.

අයිසීර් 23 මෙය ස්මෝක් ලොබි, ලිෆ්ට්, පයර් ලිෆ්ට්, සර්විසස්, ඉලෙක්ට්‍රිකල් ඩක්ට්, ඩ්‍රයිව් වේ. පම්ප් රූම්, සම්පස්, සෙකියුරිටි රූම්ස්, මුර කාමර, ස්ටීම් බාත්, පිහිනුම් තටාක, රෙස්ටෝරන්ට්, ගබඩා, පැන්ට්‍රි සහ ටොයිලට්ස්, මේවා මැසනයින් ප්ලෝර් හි පොදු පාවිචිය සඳහා ඇත.

ඉහත සඳහන් දේපළ 2012 ජනවාරි මස 12 වැනි දින පස්වරු 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* ලිප්ටන් වටරවුමේ සිට යුනියන් පෙදෙසේ මීටර් 250 ක් පමණ ඉදිරියට ගොස් හයිඩ් පාර්ක් කෝනර් මංසන්ධියෙන් වමට හැරී මීටර් 100 ක් ඉදිරියට ගියවිට වම්පස ඇති "හයිඩ් පාර්ක් රෙසිඩන්ස්" හි අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2010.08.20 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.08.20 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2010.08.17 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

(1) ගැනුම් මිලෙන් 10%(සියයට දහයක්), (2)පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුය. හිමිකම් සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 0112456458, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩී එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-636

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.